# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2017/2018

### SOC 2116 – සම්භාව්‍ය සමාජ විද්‍යා න්‍යාය

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 'යුරෝපයේ සමාජ වෙනස්වීමේ මූලික පදනම වූයේ යුරෝපයේ ඇතිවූ බුද්ධිමය පරිණාමයයි.' ඔගස්ටේ කොම්ට්ගේ "අවධි තුන" පිළිබඳ න්‍යාය ඇසුරින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

2. 'සියලු සමාජවල ඉතිහාසය වනාහී පන්ති අරගලයේ ඉතිහාසයයි.' කාල්මාක්ස්ගේ මෙම ප්‍රකාශය විමසන්න.

3. 'පන්ති විඥානය පරාරෝපිත කම්කරුවා තුළ නිසහයෙන් ගොඩනැගෙන්නක් නොවේ.' කාල් මාක්ස්ගේ මෙම අදහස සාකච්ඡා කරන්න.

4. කාර්මික ධනේශ්වර සමාජ ක්‍රමය ගොඩනැගීමෙහිලා මතවාදයේ කාර්ය භාරය පිළිබඳ මැක්ස් වෙබර්ගේ විග්‍රහය විචාරාත්මකව විමසන්න.

5. 'මැක්ස් වෙබර්ට අනුව සමාජ පන්තිය යනු ස්ථරායනයේ ආර්ථික මානය පමණි.' ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

6. 'සමාජ ඒකාබද්ධතාව යනු සියලු සමාජවල පදනමෙහි පවත්නාවූ සංසිද්ධියක් වුවද සාම්ප්‍රදායික සමාජවල සිට නූතන සමාජ දක්වා ගමන් කිරීමේදී සමාජ ඒකාබද්ධතාවෙහි ස්වරූපය ප්‍රබල වෙනසකට භාජනය වේ.' ඉහත ප්‍රකාශය එමිල් ඩර්කයිම්ගේ අදහස් ඇසුරින් සාකච්ඡා කරන්න.

***************